# තොරතුරු දැනගැනීමේ ජනතා අයිතිය තහවුරු කළ යුතුයි

## - ඇමැති මිලින්ද මොරගොඩ



මහජනතාවට තොරතුරු දැනගැනීමේ අයිතිය තහවුරු කරදීම ඉතා වැදගත් කරුණක් බව ශ්‍රී ලංකා ජාතික සංගමයේ නායක අධිකරණ හා නීති ප්‍රති-සංස්කරණ ඇමැති මිලින්ද මොරගොඩ මහතා පැවසීය. ඇමැති මිලින්ද මොරගොඩ මහතා මේ අදහස් පළකළේ තිඹිරිගස්යාය කාර්යාලයේ පැවති මාධ්‍ය හා සිවිල් සංවිධාන නියෝජිතයන් පිරිසක් සමඟ පැවති සාකච්ඡාවකදීය.

තොරතුරු දැනගැනීමේ අයි-තිය සම්බන්ධව නීති රීති හඳුන්වාදීමට ඇති හැකියාව ගැන අදහස් විමසීමට ඇති හැකියාව සම්බන්ධව පැවති මේ සාකච්ඡාවේදී තවදුරටත් අද-හස් දැක්වූ ඇමැතිවරයා මෙසේ ද පැවසීය. අපේ රටේ මේ වන විට පවතින තත්ත්වය අනුව තොරතුරු දැන ගැනීමේ අයිතිය ඉතා සීමාසහිතයි.

රටේ පවතින විවිධ කරුණු මීට බලපා තිබේ. බොහෝවිට ජනතාව අතට පත්වන්නේ සත්‍ය තොරතුරු නොවේ. හැකි-තාක් දුරට ජනතාවට රජයේ කටයුතු ගැන තොරතුරු සත්‍ය ලෙස ගලා යා යුතුයි. සමාජය යහපත් කළ හැක්කේ රජය සහ මහජනතාව අතර විශ්වාසය තහවුරු කිරීමෙන් පමණකි. සංවර්ධනය හා නීති සැලසුම් ගැන විවිධ අදහස් පැතිරෙනවා. එය විපක්ෂ දේශපාලඥයන් අදහස් දක්වන්නේ උපායමාර්-ගයක් වශයෙනි. එහෙත් සාමාන්‍ය ජනතාවට මේ තොර-තුරු ඇත්තද නැත්තද යන්න දැනගැනීමේ හැකියාවක් නැහැ. නීතිය මගින් එය තහවුරු කළ-හොත් ප්‍රජාතන්ත්‍රවාදය ශක්ති-මත් කළ හැකියි.

ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා ජනාධිපතිවරණයට ඉදිරිපත් කළ මහින්ද චින්තන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තොර-තුරු දැන ගැනීමේ අයිතිය පන-තක් මගින් ඇතිකිරීම පිළිබඳව සඳහන් කර තිබෙනවා.